තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

**එස්. ජී. එඩ්වින් එ. ආරක්ෂක අමාත්‍යාංශය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1010 /2019 (2019.06.25 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ කාර්යය පටිපාටිය).

2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - එස්. ජී. එඩ්වින්
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධරයා, ආරක්ෂක අමාත්‍යාංශය

**පෙනීසිටීම**
අභියාචක - -
පොදු අධිකාරිය - -

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018/11/12 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2018/11/29 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018/12/17 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | No response |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019/01/31 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018/11/12 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*විවිධ රාජ්‍ය ආයතන වල සේවය කොට ත්‍රිවිධ හමුදා ස්වේච්ඡා බල සේනාව වෙත ඇතුලත්ව උපරිම වයස් සීමාවට එළඹ විශ්‍රාම වැටුපක් නොලබා සේවයෙන් ඉවත්වීමට සිදු වූ අයවලුන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම සම්බන්ධයෙන් සකස් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතේ සහතික පිටපතක්.*

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

තොරතුරු නිලධාරියා 2018/11/29 දිනැතිව පහත පරිදි පිළිතුරු සපයන ලදී.

*ඔබ විසින් ඉල්ලා සිටින ලද විවිධ රාජ්‍ය ආයතන වල සේවය කොට ත්‍රිවිධ හමුදා ස්වේච්ඡා බල සේනාව වෙත ඇතුලත්ව උපරිම වයස් සීමාවට එළඹ විශ්‍රාම වැටුපක් නොලබා සේවයෙන් ඉවත්වීමට සිදු වූ අයවලුන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම සම්බන්ධයෙන් සකස් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත රහස්‍ය ලියවිල්ලක් වන බැවින් මේ අවස්ථාවේ එය ලබාදිය නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2018/12/17 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019/01/31 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

**අභියාචක 2019.06.12 දිනැති ලිපිය මගින්, තමාට කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ 2019.06.25 දිනැතිව පෙනී සිටීමට සිදුව ඇති බැවින් අභියාචනය කල තබන ලෙසට ඉල්ලා සිටින ලදී. ඒ අනුව 2019.09.24 දින ප. ව. 2.30 ට අභියාචනය කල් තබන ලදී.**

*****